# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2261/57 - 2022 ජනවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2013 (ii)

### 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 321 වන වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රෝහිත අබේගුණවර්ධන,
වරාය හා නාවික අමාත්‍ය.

2021 දෙසැම්බර් 29 වන දින,
කොළඹ දී ය.

### නියෝග

1. (1) මේ නියෝග 2021 අංක 9 දරන වෙළඳ නැව් (නැව්වල ආරක්ෂිත මෙහෙයුම් කළමනාකරණය කිරීම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ IX වන පරිච්ඡේදය,කලින් කලට සංශෝධිත පරිදි වන 1988 ප්‍රොටොකෝලය සහ එම ප්‍රොටොකෝලයට පසුව සිදුකරනු ලබන සංශෝධන, සහ (මෙහි මින්මතු "ISM සංග්‍රහය"යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර සුරක්ෂිතතා කළමනාකරණ සංග්‍රහය බලාත්මක කිරීම මේ නියෝගවල කාර්යය විය යුතු ය.

### I වන කොටස

### මේ නියෝගවල අදාළත්වය

2. (1) මේ නියෝගයේ (2) වන අනු නියෝගයේ විධිවිධානවලට යටත්ව, මේ නියෝග, ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ඇති සහ ජාත්‍යන්තර මුහුදු ගමන්වල නිරත වන (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් නැව් වර්ගවලට සහ ශ්‍රී ලංකා ජලතීරයේ ගමන් කරන වෙනත් යම් විදේශ නැව්වලට අදාළ විය යුතු ය :-


1A - G 35896 — 510 (2022/01)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(අ) ඕනෑම ප්‍රමාණයක අධිවේගී මගී බෝට්ටු ඇතුළු මගී නැව්;

(ආ) තෙල් නෞකා, රසායන ද්‍රව්‍ය නෞකා, වායු ප්‍රවාහක, තොග බඩු රැගත් නැව්, සහ දළ ටොන් 500 කට හෝ ඊට වැඩි දළ ටොන් සහිත අධිවේගී මගී බෝට්ටු; සහ

(ඇ) දළ ටොන් 500 කට හෝ ඊට වැඩි දළ ටොන් සහිත වෙනත් භාණ්ඩ නැව් සහ ජංගම අක් වෙරළ කැනීම් සිදු කිරීමේ ඒකක.

(2)(මේ නියෝගවල "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1974 මුහුදේ දී ජීවිත ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ සහ 1998 ප්‍රොටොකෝලයේ අන්‍යාකාරයෙන් ප්‍රකාශිතවම විධිවිධාන සලසා ඇත්නම් මිස, මේ නියෝග:-

(අ) යුධ නැව් සහ සෙබළ නැව්වලට;

(ආ) යාන්ත්‍රික ක්‍රම මගින් ප්‍රචලනය කරනු නොලබන නැව්වලට;

(ඇ) පුරාතනයේ ඉදිකළ දැවමය නැව්වලට;

(ඈ) වෙළඳාමේ නිරත නොවන විනෝද ගමන් යාත්‍රාවලට;

(ඉ) ධීවර යාත්‍රා සඳහා; සහ

(ඊ) වාණිජ නොවන කාර්ය සඳහා යොදාගනු ලබන, රජය විසින් මෙහෙයවන නැව්වලට,

අදාළ නොවිය යුතු ය.

3. (1) සාමාන්‍යයෙන් මුහුදු ගමන්වල නිරත නොවන, නමුත් අතිවිශේෂ අවස්ථාවන් හි දී, එක් ජාත්‍යන්තර මුහුදු ගමනක් යාමට භාර ගැනීමට නියම කරනු ලබන නැවක්, (මේ නියෝගවල "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙළෙඳ නැව් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මේ නියෝගවල කුමන හෝ අවශ්‍යතාවයකින් නිදහස් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, එකී නැව විසින්, නැව විසින් භාර ගැනීමට නියමිත මුහුදු ගමන සඳහා, අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ මතය අනුව, ප්‍රමාණවත් සුරක්ෂිතතා කළමනාකරණ නියමයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගය යටතේ ප්‍රදානය කරන නිදහස් කිරීමක්, 2022.01.06 දිනැති අංක 2261/49 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2021 අංක 01 දරන වෙළෙඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝගවලට අනුකූලව නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) සාධාරණ දැනුම්දීමකින් පසු, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මේ නියෝගය යටතේ ප්‍රදානය කරන ලද යම් නිදහස් කිරීමක්, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

### සුරක්ෂිතතා කළමනාකරණ නියම

4. (1) සමාගම සහ නැව විසින් ISM සංග්‍රහයේ නියමයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය. මේ නියෝගයේ කාර්යය සඳහා, ISM සංග්‍රහයේ නියම, අනිවාර්යය ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) පිළිවෙළින් 5 වන සහ 6 වන නියෝග යටතේ නිකුත් කරන ලද වලංගු අනුකූලතා ලේඛනයක් හෝ වලංගු අතුරු අනුකූලතා ලේඛනයක් දරන යම් සමාගමක් විසින්, මේ නියෝග අදාළ වන යම් නැවක් මෙහෙයවනු ලැබිය යුතු ය.

5. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ (මෙහි මින්මතු "පිළිගත් සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළිගනු ලබන යම් සංවිධානයක් විසින්, ISM සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කරන සෑම සමාගමක් වෙතම අනුකූලතා ලේඛනයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) අනුකූලතා ලේඛනයේ පිටපතක් නැවේ තැබිය යුතු අතර ඉල්ලීමක් කිරීමේ දී නෞකාධිපතිවරයා විසින් එය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම ලේඛනයේ පිටපත සත්‍යවත් කිරීම හෝ සහතික කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(3) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ පිළිගත් සංවිධානය විසින්, මේ නියෝග අදාළ වන ශ්‍රී ලංකාවේ සෑම නැවක් වෙතම සුරක්ෂිතතා කළමනාකරණ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය. සුරක්ෂිතතා කළමනාකරණ සහතිකය නිකුත් කිරීමට පෙර, සමාගම සහ එහි නෞකාස්ථ කළමනාකරණය, ISM සංග්‍රහයේ නියම කර ඇති සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතියට අනුකූලව මෙහෙයවන බව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ පිළිගත් සංවිධානය විසින් පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(4)10 වන නියෝගයට යටත්ව, අනුකූලතා ලේඛනය සහ සුරක්ෂිතතා කළමනාකරණ සහතිකය, ඒවා නිකුත් කරනු ලැබූ දින සිට අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා වලංගු වන්නේ ය.

6. (1)අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ පිළිගත් සංවිධානයක් විසින්, පරීක්ෂා කිරීමෙන් පසු සමාගම අලුතින් පිහිටුවන ලද සමාගමක් වන බවට හෝ පවත්නා අනුකූලතා ලේඛනයට අලුත් නැව් වර්ග එකතු කළ යුතු බවට සෑහීමකට පත්වීමේ දී, ISM සංග්‍රහයේ මූලික ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීමට අතුරු අනුකූලතා ලේඛනයක් නිකුත් කරනු ලැබිය හැකි වුව ද, සමාගම විසින් අතුරු අනුකූලතා සහතිකයේ වලංගු කාල සීමාව ඇතුළත ISM සංග්‍රහයේ සම්පූර්ණ අවශ්‍යතා සපුරාලමින් සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා වන සැලසුම් ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(2)10 වන නියෝගයට යටත්ව, අතුරු අනුකූලතා ලේඛනයක් මාස දොළහක කාලයක් සඳහා වලංගු වන්නේ ය.

(3) අතුරු අනුකූලතා ලේඛනයේ පිටපතක් නැවේ තැබිය යුතු අතර ඉල්ලීමක් කිරීමේ දී නෞකාධිපතිවරයා විසින් එය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම ලේඛනයේ පිටපත සත්‍යවත් කිරීම හෝ සහතික කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(4) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ පිළිගත් සංවිධානයක් විසින් -

(අ) බෙදාහැරීමේ හෝ ප්‍රධාන පරිවර්තන සහිත අලුත් නැව් සඳහා;

(ආ) කළමනාකරණය සඳහා වන වගකීම සමාගම විසින් අලුතින් භාරගන්නා ලද නැව් සඳහා; හෝ

(ඇ) පනත යටතේ පළමුවරට ලියාපදිංචි කිරීම සඳහා භාරගන්නා ලද නැව් සඳහා,

අතුරු සුරක්ෂිතතා කළමනාකරණ සහකිතකයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(5) මේ නියෝගයේ (4) වන අනු-නියෝගයේ සඳහන් අතුරු සුරක්ෂිතතා සහතිකය ඃ-

(අ) අදාළ නැවට අනුකූලතා ලේඛනය හෝ අතුරු අනුකූලතා ලේඛනය අදාළ බව;

(ආ) සමාගම විසින් අදාළ නැව වෙත සපයන ලද සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතියෙහි ISM සංග්‍රහයේ ප්‍රධාන මූලිකාංග ඇතුළත් බව හා එම පද්ධතිය, අනුකූලතා ලේඛනය නිකුත් කිරීම සඳහා වන විගණනයේ දී තක්සේරු කරන ලද බව හෝ අතුරු අනුකූලතා ලේඛනය නිකුත් කිරීම සඳහා ප්‍රදර්ශනය කරන ලද බව;

(ඇ) සමාගම විසින්, නැවේ අභ්‍යන්තර විගණනය මාස තුනක් ඇතුළත සැලසුම් කර ඇති බව;

(ඈ) නෞකාධිපතිවරයා සහ නිලධරයන් සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය පිළිබඳ සහ එය ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සහගත වැඩපිළිවෙළ පිළිබඳ හොඳින් දැනුවත් බව;

(ඉ) අත්‍යවශ්‍ය යැයි හඳුනාගන්නා ලද උපදෙස් යාත්‍රා කිරීමට පෙරාතුවලබා දී ඇති බව; සහ

(ඊ) සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය පිළිබඳ අදාළ තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් ලබා දී ඇති බව;

පරීක්ෂා කිරීමෙන් සිදු කිරීමෙන් පසු නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) 10 වන නියෝගයට යටත්ව, අතුරු සුරක්ෂිතතා කළමනාකරණ සහතිකය මාස හයක කාලයක් සඳහා වලංගු විය යුතු ය. විශේෂ අවස්ථාවල දී, සාධාරණ හේතු ඉදිරිපත් කිරීමෙන් පසු, අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ අනුමතය මත පිළිගත් සංවිධානයක් විසින්, එම සහතිකයේ වලංගු කාල සීමාව තවදුරටත් වූ මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(7) 5 වන නියෝගයේ සඳහන් අනුකූලතා ලේඛනය සහ සුරක්ෂිතතා කළමනාකරණ සහතිකය සහ 6 වන නියෝගයේ සඳහන් අතුරු අනුකූලතා ලේඛනය සහ අතුරු සුරක්ෂිතතා කළමනාකරණ සහතිකය, ISM සංග්‍රහයේ දී ඇති ආකෘතීන්ට අනුරූප වන ආකාරයට පිළියෙල කරනු ලැබිය යුතු අතර, කාර්යය සිදු කරන භාෂාවෙන් සහ ඉංග්‍රීසි භාෂාවෙන් යුක්තව, ඒවා නැවේ තැබිය යුතු ය.

7. විදේශ නැවක් සම්බන්ධයෙන් වන විට, 5 වන නියෝගයේ සඳහන් අනුකූලතා ලේඛනය සහ සුරක්ෂිතතා කළමනාකරණ සහතිකය සහ 6 වන නියෝගයේ සඳහන් අතුරු අනුකූලතා ලේඛනය සහ අතුරු සුරක්ෂිතතා කළමනාකරණ සහතිකය, නැව ප්‍රදර්ශනය කරන ධජය අයත් රාජ්‍යය විසින් හෝ ඒ වෙනුවට කටයුතු කරන පිළිගත් සංවිධානය විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

8. 5 වන නියෝගයේ සඳහන් අනුකූලතා සහතිකයට සහ සුරක්ෂිතතා කළමනාකරණ සහතිකයට අදාළව ISM සංග්‍රහය මගින් නියම කරනු ලබන සියලුම පරීක්ෂා කිරීම්, සංවිධානය විසින් සකස් කරන ලද මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් ISM සංග්‍රහය මගින් නියම කරන ලද කාලසීමාවේ දී ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. එම පරීක්ෂා කිරීම්වලට සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතියේ විගණනයක් ඇතුළත් වේ.

9. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මේ නියෝග අදාළ වන යම් සමාගමක් හෝ නැවක් පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(2) පහත සඳහන් අවස්ථාවල, එනම් -

(අ) මගියකු හෝ නාවික සේවක මඬුල්ලේ යම් සාමාජිකයකු වන විට; හෝ

(ආ) (i) සමීක්ෂණයකදී හෝ සාමාන්‍ය පරීක්ෂා කිරීමකින් සොයා ගනු ලැබූ දේ ඇති විට; හෝ

(ii) අනතුරු හෝ බරපතල යන්ත්‍රසූත්‍ර ඇනහිටීම් මගින් සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතියේ සිදුවිය හැකි අඩුපාඩු පෙන්නුම් කරන විට,

නැවේ හෝ සමාගමේ පසු-විපරම් අතිරේක පරීක්ෂා කිරීමක් අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ පිළිගත් සංවිධානයක් විසින් පවත්වනු ලැබිය හැකි ය.

10. (1) (2) වන අනු නියෝගයේ ලැයිස්තු ගත කුමන හෝ අවස්ථාවක දී, ISM සංග්‍රහය යටතේ නිකුත් කරන ලද අදාළ යම් ලේඛනයක්, ඒ සඳහා හේතු දැක්වීමෙන් පසු, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ලිඛිතව දැන්වීමක් මගින් අත්හිටුවීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන අනු නියෝගයේ සඳහන් අවස්ථා වන්නේ -

(අ) වැරදි තොරතුරු මත පදනම්ව ලේඛනය නිකුත් කර තිබීම;

(ආ) ලේඛනයට අදාළ ISM සංග්‍රහයේ 'ආ' කොටස මගින් නියම කරන ලද විගණනයක්, ISM සංග්‍රහය මගින් නියම කරන ලද කාලසීමාවේ දී සිදුවී නොමැති වීම;

(ඇ) සමාගමේ හෝ නැවේ කළමනාකරණ ව්‍යුහය, මෑතක දී ම කරන ලද විගණනයේ සිට වෙනස් වී තිබීම;

(ඈ) විගණනයෙන් පසු නැව හෝ සමාගම ISM සංග්‍රහයට තවදුරටත් අනුකූල නොවන බව සොයා ගනු ලැබීම,

(3) අනුකූලතා ලේඛනයකට අදාළව (1) වන අනු නියෝගය යටතේ දැන්වීමක් ලබා දී ඇත්නම්, යම් ආශ්‍රිත සුරක්ෂිතතා කළමනාකරණ සහතික හෝ අතුරු සුරක්ෂිතතා කළමනාකරණ සහතික වලංගු නොවිය යුතු ය.

(4) (1) වන අනු නියෝගය යටතේ වන දැන්වීමක් -

(අ) දැන්වීම ලබාදීමට පෙර අදාළ ලේඛනය දරන්නාට කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දී ඇත්නම්; හෝ

(ආ) හදිසි ආරක්ෂණ හෝ දූෂණය වැළැක්වීම පිළිබඳ සලකා බැලීම් හේතුවෙන් දැන්වීම වහාම ලබාදිය යුතු බව නියම කරන බව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සලකා බලනු ලබයි නම්,

පමණක් වලංගු වන්නේ ය.

11. (1) (අ) සම්මුතිය අදාළ වන යම් රාජ්‍යයක ආණ්ඩුව විසින් කරන ලද ඉල්ලීමක දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, එම රටේ සහ සමාගමේ ලියාපදිංචි කරන ලද නැවක සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය විගණනය කරනු ලැබිය හැකි ය.

(ආ) එවැනි ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් විගණනයක් සිදු කිරීමෙන් ISM සංග්‍රහයේ නියමයන් සපුරා ඇති බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා සෑහීමකට පත් වන අවස්ථාවක දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුකූලතා ලේඛනයක් හෝ සුරක්ෂිතතා කළමනාකරණ සහතිකයක්, සමාගම වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. නැතහොත්, උචිත අවස්ථාවන් හි දී ISM සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති අදාළ පරීක්ෂා කිරීම් සිදු කිරීමෙන් පසු සම්මුතියේ නියමයන්ට අනුකූලව එවැනි ලේඛනයක් පිටසන් කරනු ලැබිය හැකි ය. නෞකාව විසින් යම් ධජයක් දරනු ලබන්නේ ද එම ධජය අයත් රාජ්‍යයේ ආණ්ඩුවේ ඉල්ලීම පරිදි එය නිකුත් කරනු ලැබූ බවට වන ප්‍රකාශයක්, එසේ නිකුත් කරන ලද හෝ පිටසන් කරන ලද යම් සහතිකයක ඇතුළත් විය යුතු අතර ඊට, ඉල්ලීම ඉදිරිපත් කළ ආණ්ඩු විසින් නිකුත් කරන ලද සහතිකයක පවතින බලාත්මකභාවය ම තිබිය යුතු අතර එම පිළිගැනීම ම ලැබිය යුතු ය.

(2) (අ) ශ්‍රී ලංකාවේ සහ සමාගමේ ලියාපදිංචි කරන ලද නැවක සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය සහ සමාගම විගණනය කිරීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සම්මුතිය අදාළ වන රාජ්‍යයේ ආණ්ඩු වෙතින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(ආ) එවැනි රාජ්‍යයක් විසින් එම ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් විගණනයක් සිදු කරනු ලැබීමෙන් සහ ISM සංග්‍රහයේ නියමයන් සපුරා ඇති බවට සෑහීමකට පත්වන අවස්ථාවක දී, අනුකූලතා ලේඛනයක් හෝ සුරක්ෂිතතා කළමනාකරණ සහතිකයක් සමාගම වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. නැතහොත් උචිත අවස්ථාවන් හි දී, ISM සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති අදාළ පරීක්ෂා කිරීම් සිදුකිරීමෙන් පසු සම්මුතියේ නියමයන්ට අනුකූලව එම ලේඛනය පිටසන් කරනු ලැබිය හැකි ය. ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ ඉල්ලීම පරිදි එය නිකුත් කරනු ලැබූ බවට වන ප්‍රකාශයක්, එසේ නිකුත් කරන ලද හෝ පිටසන් කරන ලද යම් සහතිකයක ඇතුළත් විය යුතු අතර ඊට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක පවතින බලාත්මකභාවය ම තිබිය යුතු අතර එම පිළිගැනීම ම ලැබිය යුතු ය.

12. (1)එක් එක් නැවෙහි ආක්ෂිත මෙහෙයුම සහතික කරගැනීම සහ සමාගම හා සමාගමේ නෞකාස්ථ නැව් අතර සබඳතාවක් ලබාදීම සඳහා කළමනාකරණයේ ඉහළම මට්ටම වෙත සෘජු ප්‍රවේශවීමක් ඇති ගොඩබිමෙහි සිටින එක් තැනැත්තකු හෝ එක් තැනැත්තකුට වඩා වැඩි පිරිසක් සෑම සමාගමක් විසින් ම නම් කරනු ලැබිය යුතු ය.

(2) නම් කරනු ලැබූ තැනැත්තාගේ වගකීම සහ අධිකාරය, ISM සංග්‍රහයට අනුකූලව විය යුතු ය.

(3) මේ නියෝගයේ (1) වන අනු නියෝගයට අනුව, ජාත්‍යන්තර සුරක්ෂිතතා කළමනාකරණ (ISM) සංග්‍රහයේ විධිවිධාන යටතේ නම් කරනු ලැබූ තැනැත්තාගේ කාර්යභාරය භාරගන්නා තැනැත්තාට, සංවිධානය විසින් සකස් කරන ලද මාර්ගෝපදේශයන් හි නියම කර ඇති අවශ්‍ය සුදුසුකම්, පුහුණුව සහ පළපුරුද්ද තිබිය යුතු ය.

(4) (1) වන අනු නියෝගයට අනුව එම තැනැත්තන් නම් කරන සෑම සමාගමක් විසින් ම, නම් කරනු ලැබීමෙන් පසු වහාම ඔවුන්ගේ සුදුසුකම්, පුහුණුව සහ පළපුරුද්ද සමග ඔවුන් පත් කිරීම පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු ය.

13. සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය, ISM සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

14. 5(3) වන නියෝගයේ විධිවිධානයන්ට අනුව නිකුත් කරන ලද සහතිකයක් දැරීමට නියමිත නැවක්, සම්මුතියේ XI-I වන පරිච්ඡේදයේ 4 වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව පාලනය කිරීමට යටත් විය යුතු ය. මේ කාර්ය සඳහා, එම සහතිකය, සම්මුතියේ I වන පරිච්ඡේදයේ 12 වන හෝ 13 වන නියෝග යටතේ නිකුත් කරන ලද සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## III වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

15. ශ්‍රී ලංකාවේ පිහිටි යම් වරායක හෝ යම් ස්ථානයක ඇති යම් නැවක් අනාරක්ෂිත නැවක් ලෙස හඳුනාගනු ලබන අවස්ථාවක දී, එනම්, එවැනි නැවක නැව් බඳේ, උපකරණවල, යන්ත්‍ර සූත්‍රවල දෝෂ සහගත තත්ත්වයක්, සේවක පිරිස අඩු බව, අධිකව පැටවීම හෝ නුසුදුසු පැටවීම හේතුවෙන් හෝ සම්මුතිය සමඟ අනුකූල නොවන වෙනත් යම් තත්ත්වයක් හේතුවෙන්, එකී නැව සිදු කිරීමට අදහස් කරන සේවයේ ස්වාභාවය අනුව, මිනිස් ජීවිතවලට බරපතල හානි සිදු නොකරමින් මුහුදට ගමන් කිරීමට නොහැකි වන යම් අවස්ථාවක දී, එහි දෝෂ සහගත තත්ත්වය සමීක්ෂණය කිරීමේ හෝ එම දෝෂය නිවැරදි කිරීමේ කාර්යය සඳහා එකී නැව තාවකාලිකව රඳවා තබා ගනු ලැබිය හැකි ය.

16. සම්මුතියේ IX වන පරිච්ඡේදයේ පාද සටහන් සහ එම පාද සටහන් මගින් සඳහන් කරන ලද යෝජනා සම්මතයන්, චක්‍රලේඛ හෝ ලේඛන, මේ නියෝගවල කොටසක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

17. වෙළඳ නැව් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මේ නියෝගවල විධිවිධාන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි, සම්මුතියේ හෝ 1988 ප්‍රොටොකෝලයේ විධිවිධානවල අවම තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියා කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් නිකුත් කරනු ලැබිය හැකි ය.

18. මේ නියෝගවල :-

"පනත" යන්නෙන්, 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත අදහස් වේ ;

"විගණනය" යන්නෙන්, සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය, සැලසුම් කරන ලද වැඩපිළිවෙල හා අනුකූල වන්නේ ද සහ එම වැඩපිළිවෙල ඵලදායී ලෙස ක්‍රියාත්මක වන්නේ ද සහ අපේක්ෂිත පරමාර්ථ ළඟාකර ගැනීමට ප්‍රමාණවත් වන්නේ ද යන වග තීරණය කිරීම සඳහා වන ක්‍රමානුකූල සහ ස්වාධීන පරීක්ෂා කිරීම අදහස් වේ ;

"තොග බඩු රැගත් නැව්" යන්නෙන්, සාමාන්‍යයෙන් නැව් බඩු සඳහා වන අවකාශයන් හි තනි නැව් තට්ටුවක්, ඉහළින් ඇති ටැංකි සහිතව ඉදි කරන ලද නැවක් අදහස් වන අතර, එමගින් මූලිකව ම තොග වශයෙන් වන වියළි නැව් බඩු ප්‍රවාහනය කිරීමට අදහස් කරනු ලබන අතර ඊට ලෝපස් ප්‍රවාහන නැව් සහ මිශ්‍ර නැව් වැනි නැව් වර්ග ඇතුළත් වේ ;

"රසායන ද්‍රව්‍ය නෞකාව" යන්නෙන් ජාත්‍යන්තර තොග රසායන ද්‍රව්‍ය සංග්‍රහයේ 17 වන පරිච්ඡේදයේ ලැයිස්තුගත යම් ද්‍රව නිෂ්පාදන තොග වශයෙන් ප්‍රවාහනය කිරීම සඳහා ඉදි කරන ලද හෝ සුදුසු ලෙස සකස් කරන ලද සහ භාවිත කරනු ලබන භාණ්ඩ ප්‍රවාහන නෞකාවක් අදහස් වේ ;

"සමාගම" යන්නෙන්, නෞකාවේ අයිතිකරු හෝ අයිතිකරුගෙන් නෞකාව මෙහෙයවීමේ වගකීම පවරාගනු ලැබුවා වූ ද, එසේ වගකීම පවරා ගැනීමෙන් පසුව ජාත්‍යන්තර සුරක්ෂිතතා කළමනාකරණ සංග්‍රහය මගින් පනවා ඇති සියලු කාර්ය සහ වගකීම් භාර ගැනීමට එකඟ වී ඇත්තා වූ ද, කළමනාකරුවකු හෝ ආවරණ රහිත බෝට්ටු 'චාටර් ක්‍රමය'ට කුලියට දෙන තැනැත්තකු හෝ එවැනි වෙනත් යම් සංවිධානයක් නැතහොත් තැනැත්තකු අදහස් වේ ;

"වායු ප්‍රවාහකය" යන්නෙන් ජාත්‍යන්තර වායු ප්‍රවාහනය කිරීමේ සංග්‍රහයේ 19 වන පරිච්ඡේදයේ ලැයිස්තු ගත යම් ද්‍රවීකරණය කළ වායු හෝ වෙනත් නිෂ්පාදනයක් තොග වශයෙන් ප්‍රවාහනය කිරීම සඳහා ඉදිකරන ලද හෝ සුදුසු ලෙස සකස් කරන ලද සහ භාවිත කරනු ලබන භාණ්ඩ නැවක් අදහස් වේ ;

"අධිවේගී බෝට්ටු" යන්නෙන්, තත්පරයකට මීටර් 3.7 $\nabla^{0.1667}$ (මී/ත) සමාන හෝ එය ඉක්මවන උපරිම වේග ධාරිතාවක් සහිත බෝට්ටුවක් අදහස් වේ ;

$\nabla$ = පොළව මට්ටම මගින් උපදවන වායු ගතික ප්‍රබලතාවන් මගින් ජල පීඩනය රහිත ආකාරයේ දී ජල තලයට උඩ පැහැදිලි කිරීමට සම්පූර්ණයෙන්ම උපකාරීවන නැව් බඳ නොමැතිව නිර්මිත ජල තීරයට අනුරූප වන ජල පීඩන ධාරිතාව ;

"ජාත්‍යන්තර සුරක්ෂිතතා කළමනාකරණ (ISM) සංග්‍රහය" යන්නෙන්, සංවිධානය විසින් සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි, A.741 (18) වන යෝජනා සම්මතය මගින් සංවිධානය විසින් සම්මත කරනු ලැබූ නැව්වල ආරක්ෂිත මෙහෙයුම සහ දූෂණය වැළැක්වීම සඳහා වන ජාත්‍යන්තර කළමනාකරණ සංග්‍රහය අදහස් වේ ;

"ජංගම අක්වෙරළ කැනීම් සිදු කිරීමේ ඒකකය" යන්නෙන් ද්‍රවමය හෝ වායුමය හයිඩ්‍රොකාබන්, ගෙන්දගම් හෝ ලුණු වැනි සාගර පතුල යට ඇති සම්පත් ගවේෂණය කිරීම හෝ උපයෝජනය කිරීම සඳහා කැනීමේ මෙහෙයුම්වල නිරත විය හැකි යාත්‍රාවක් අදහස් වේ ;

"තෙල් නෞකාව" යන්නෙන්, 1973 නැව්වලින් වන දූෂණය වැළැක්වීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතියේ 1978 ප්‍රොටොකෝලයේ I වන ඇමුණුමේ 1 වන නියෝගයේ නිර්වචනය කොට ඇති තෙල් නෞකාව අදහස් වේ ;

"සංවිධානය" යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය අදහස් වේ ;

"සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය" යන්නෙන්, සමාගමේ සුරක්ෂිතතා සහ පාරිසරික ආරක්ෂණ පද්ධතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සමාගමේ කාර්ය මණ්ඩලයට හැකියාව ලබාදෙන ව්‍යුහගත සහ ලේඛනගත පද්ධතියක් අදහස් වේ.

EOG 01 - 0249

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.